# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1955/22 - 2016 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2016.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශේෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති උපලේඛනයෙහි I කොටසෙහි, අංක 14 යටතේ සඳහන් බලතල පැවරීමට අදාළ විධිවිධාන වෙනුවට පහත අංක 14 (අ) සහ (ආ) යටතේ සඳහන් විධිවිධාන ආදේශ කරමින් ද, පහත අංක 17 සහ 18 හි සඳහන් විධිවිධාන ඇතුළත් කරමින් ද, එම උපලේඛනයේ I කොටස 2016.02.11 දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

02.

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 14. (අ) ප්‍රාදේශීය ලේකම්වරු | ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල වාර්ෂික ස්ථාන මාරු කිරීම<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 14. (ආ) අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු<br>සහකාර දිස්ත්‍රික් ලේකම්වරු<br>සහකාර ප්‍රාදේශීය ලේකම්වරු<br>(අමාත්‍යාංශය ඇතුළත) | ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |


1A - PG 2860 — 206 (2016/02)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 17. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ,<br>(අ) ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයන්<br>(ආ) විගණන පරීක්ෂක සේවයට අයත් අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම<br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 18. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ,<br>(අ) අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමට අයත් විගණන පරීක්ෂක සේවයේ නිලධරයන්<br>(ආ) ඒකාබද්ධ සේවාවලට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික හා ද්වීතියික මට්ටමේ නිලධරයන් | විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථා අනුව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම.<br>(III) විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. |

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 පෙබරවාරි මස 23 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

03 - 288

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.